(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 382.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 අගෝස්තු මස 06 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2642/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල කාන්තාවන් විසින් මූලිකත්වය දරනු ලබන පවුල්වලට සුදුසු ආර්ථික ක්‍රියාවලියකට යොමු වීම සඳහා එක් පවුලකට රුපියල් ලක්ෂ 2කට නොවැඩි වූ ණය මුදලක් සහන පොලියක් යටතේ ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3272/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුද්ගලික බස්රථ සංකල්පය තුළින් රටේ පොදු ප්‍රවාහන පද්ධතියට යහපතක් ඇති වී තිබේද;

(ii) දිස්ත්‍රික් පදනම මත බලපත්‍ර ලබා දී ඇති පුද්ගලික බස්රථ ධාවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට ධාවනය කෙරෙන පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම සියලුම බස්රථ ධාවනය කරනු ලබන්නේ බලපත්‍ර සහිතවද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පුද්ගලික බස්රථ ධාවකයින්ට රජයෙන් ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(ii) මෙරට පුද්ගලික බස්රථ කර්මාන්තය තුළින් කොපමණ ආසන ධාරිතාවක් සැපයේද;

(iii) ජාතික සහ පළාත් මට්ටමෙන් එක් බස්රථයකින් වර්ෂයකට උපයනු ලබන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3701/'13

3\.
ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රජයට බදු ගෙවනු ලබන රාජ්‍ය හා පුද්ගලික ඉන්ධන අලෙවි සමාගම් කවරේද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ එම එක් එක් සමාගම වාර්ෂිකව ගෙවන ලද බදු ප්‍රමාණයන් එක් එක් බදු වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදු ගෙවීමේදී කවර හෝ සමාගමක් සඳහා, කවර හෝ බදු නිදහසක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(v) එවන් බදු සහනයක් ලබාදීමට හේතු කවරේද;

(vi) පසුගිය වර්ෂ දහය තුළ එම බදු සහනය ලබාදීම නිසා ශ්‍රී ලංකා රජය වෙත අහිමි වී ඇති බදු මුදල් ප්‍රමාණය එක් එක් බදු වර්ගය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3824/'13

4\.
ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ සේවය කරන සනීපාරක්ෂක කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල්වල සිටින රෝගීන් වෙනුවෙන් සනීපාරක්ෂක කම්කරුවන් ඉටුකරන කාර්යභාරය කවරේද;

(iv) එක් එක් ශික්ෂණ රෝහලේ සනීපාරක්ෂක කම්කරුවන් සඳහා දීමනා ඇතුළුව වැටුප් සඳහා ලබාදී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂයේදී එක් එක් ශික්ෂණ රෝහලේ සනීපාරක්ෂක කටයුතු සඳහා පුද්ගලික අංශයට ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මුදල් ගෙවා ඇති පුද්ගලික ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3919/'13

5\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඹ, කෙසෙල්, ගස්ලබු වැනි පළතුරු කල්තබා ගැනීමට සහ ඉක්මනින් ඉදවීමට ඇතැම් ව්‍යාපාරිකයින් විවිධ රසායනික ද්‍රව්‍ය භාවිතා කරන බව පිළිගන්නේද;

(ii) එලෙස භාවිතා කරනු ලබන ද්‍රව්‍යවල රසායන විද්‍යාත්මක නාම හා වෙළඳ නාම කවරේද;

(iii) එම රසායනික ද්‍රව්‍ය අතරින් මිනිස් සිරුරට අහිතකර ද්‍රව්‍ය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළතුරු ඉදවීමට සහ කල්තබා ගැනීමට මිනිස් සිරුරට අහිතකර රසායනික ද්‍රව්‍ය යොදා ගන්නා ව්‍යාපාරිකයින් නීතියේ රැහැනට හසුකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) 2011 සහ 2012 වර්ෂවල නීතියේ රැහැනට හසුකර ගන්නා ලද එවැනි ව්‍යාපාරිකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් දඩුවම් ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4506/'13

6.

ගරු සුජීව සේනසිංහ මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා දහයක් මිලදී ගැනීමේ සැලසුමක් ඇති බව දන්නේද;

(ii) මිලදී ගැනීමට අපේක්ෂිත එම ගුවන් යානා සඳහා වැය කිරීමට නියමිත මුදල කොපමණද;

(iii) එම ගුවන් යානා මිලදී ගන්නේ කුමන රටකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) ගුවන් සමාගම 2013 ජනවාරි සිට මේ දක්වා ලැබූ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධික පාඩු ලබමින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා මිලදී ගැනීමට ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

(iii) එම නව ගුවන් යානා මිලදී ගැනීම අනුමත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4522/'13

7.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශක්ති ජනක පානයක් ලෙස වෙළඳපොළට හඳුන්වා දී ඇති 'රෙඩ් බුල්' නම් වූ පානය දේශීය වෙළඳපොළ තුළ ජනප්‍රිය කරවීමටත්, අලෙවි කිරීමටත් කටයුතු සිදුකරන බව එතුමා දන්නෙහිද?

(ආ) එම බීම වර්ගය පානය කිරීම තුළින් අතුරු ආබාධ ඇතිවීමේ හැකියාව සලකා බලා ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය විසින් තහනම් කිරීමට කටයුතු කර තිබියදීත්, නැවත එම පානය ආනයනය කිරීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් අවසර ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4737/’14

8\.
ගරු මොහමඩ් අස්ලම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොලොන්නාව, පන්සල්හේන පාර, අංක 9/1 දරන ස්ථානයේ පදිංචි, ඒ. ඒ. සාබ්ජු මහතා විසින් අංක 38 ශ්‍රී 6185 දරන මහේන්ද්‍රා ජීප් රථය එහි මුල් අයිතිකාරිය වන පී. විජේසූරිය යන අයගෙන් මිලට ගෙන, එම මෝටර් රථයේ ලියාපදිංචිය නිල වශයෙන් ඔහුගේ නමට පවරා ගැනීම පිණිස වර්ෂ 2007 දී අයදුම්පත්‍රයක් (අංක TR 200760250) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබ ඇති බවත්;

(ii) වර්ෂ කිහිපයක් ගතවී ඇතත්, උක්ත අයදුම්පතට අනුව මෙතෙක් එම වාහනයේ නීත්‍යානුකූල පැවරීම් කටයුතු සිදු වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් වාහනයේ ලියාපදිංචි අයිතිය සාබ්ජු මහතාගේ නමට පැවරීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4749/’14

9\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මධ්‍යම රජය විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

(ii) පළාත් සභා විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

(iii) ප්‍රාදේශීය සභා විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මධ්‍යම රජය විසින් නඩත්තු කරනු ලබන මාර්ග අතරින් මේ වන විට කාපට් අතුරා ඇති මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4845/’14

10\.
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ප්‍රමිතියෙන් තොර බලාගාරයක් බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රකාශකර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) එම බලාගාරයේ,

(i) පළමුවන අදියර වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල හා වැය කළ මුදල කොපමණද;

(ii) ප්‍රමිතිය, උපකරණ හා ක්‍රියාකාරී තත්ත්වය සම්බන්ධයෙන් අදාළ ඉදිකිරීම් සමාගම සමග වගකීම් කාලයක් සහිත ගිවිසුමකට එළැඹ සිටියේද;

(iii) ප්‍රමිතියෙන් තොර තත්ත්වය හා සිදුවන අක්‍රියවීම් සම්බන්ධයෙන් බලාගාරය ඉදිකළ සමාගමට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) අලුත්වැඩියාවන්වලට සහ එම කාලය තුළ අහිමි වූ විදුලි බලය ලබා ගැනීමට වැය වූ අතිවිශාල මුදල ඊට වගකිව යුත්තන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

(v) පළමුවැනි අදියර නිසි පරිදි ඉදි නොකළ සමාගම විසින්ම එහි ඊළඟ අදියරයන්ද ඉදිකරනු ලබන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිරියේදී මහජනතාවට ප්‍රතිලාභ ලබා දිය හැකි වන පරිදි විදුලිය නිපදවීමට සැලසුම් කර තිබේද;

(ii) විදුලි බිල අඩුවීමට හේතු වන එම සැලසුම දින වකවානු සහිතව කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4852/'14

11.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු ව්‍යාපාර පවත්වාගෙන යාම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා නිකුත් කර ඇති ලියාපදිංචි සහතික සංඛ්‍යාව කොපමණද;

(ii) එකී එක් එක් ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද්දේ කවර පුද්ගලයින් වෙතද;

(iii) එකී එක් එක් ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද නිවැරදි දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4865/'14

12.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොඩිකාමම්, එරියාන්පිටි සුසාන භූමියට පිවිසෙන මාර්ගය ගමන් කිරීමට නුසුදුසු තත්ත්වයේ තිබෙන බවත්;

(ii) වර්ෂාව පවතින කාලයේදී එම සුසාන භූමියට පිවිසීමට නොහැකි ආකාරයෙන් මාර්ගයේ ඇති වලවල්වල වතුර පිරෙන නිසා මෘත දේහයන් රැගෙන යාමේදී ජනතාව නොයෙක් දුෂ්කරතාවලට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කොඩිකාමම්, එරියාන්පිටි සුසාන භූමියට පිවිසෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට වහාම පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4908/'14

13.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල, ඇතිමලේවැව, රෝහල ඉදිරිපිට, අංක 127/1හි පදිංචි ඩබ්ලිව්. එම්. වීරසිංහ මහතා මිනුම්පති දෙපාර්තමේන්තුවේ මැනුම් ක්ෂේත්‍ර සහායකයෙකු ලෙස (ඩබ්ර්/ඩබ/158) සේවය කළ බවත්;

(ii) පොලොන්නරුව නව නගරයේ මිනින්දෝරු කාර්යාලයේ සේවය කරමින් සිටියදී, මිනුම්පතිගේ අංක සීජී/1/1/1/වී/460 හා 2004.08.20 දිනැති ලිපිය මගින් ඔහුගේ වැඩ තහනම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වීරසිංහ මහතාගේ වැඩ තහනම් කිරීමට හේතුපාදක වූ බදුල්ල මහාධිකරණයේ පැවති අංක 91/2003 දරන නඩුව සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් කළ විමර්ශනයෙන් පසු, 2012.11.02 දින ඒ මහතාව එම නඩුවෙන් නිදොස් කොට නිදහස් කර ඇති බැවින්, වැඩ තහනමට ලක් වූ දින සිට ඔහුට හිමි හිඟ වැටුප් ලබාදීමට සහ ඔහුගේ විශ්‍රාම වැටුප ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4952/'14

14\.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, මහවැව සිට කටුනේරිය දක්වා මුහුදු තීරයේ වෙරළ දැඩි ඛාදනයකට ලක්වෙමින් පවතින බව දන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශයේ වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ක්‍රියා මාර්ග ගැනීමෙන් පසුවද වෙරළ ඛාදනය වළක්වා ගත නොහැකි වී තිබේද;

(iii) එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ප්‍රදේශයේ සිදුවූ වෙරළ ඛාදනය නිසා විනාශ වී ඇති හා විනාශ වීමේ තර්ජනයට ලක්වී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විනාශ වී ඇති නිවාස හා දේපළ වෙනුවෙන් වන්දි මුදල් ගෙවීමේ වැඩ පිළිවෙළක් අරඹා තිබේද;

(iii) එම වන්දි මුදල තක්සේරු කිරීමේ ක්‍රමවේදය කවරේද;

(iv) වෙරළ ඛාදනය නිසා අවතැන් ජනතාවගේ ජන ජීවිතය සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4962/'14

15\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂය තුළ පොහොර සහනාධාරය ලබා දුන් ගොවීන් සංඛ්‍යාව එක් එක් බෝග වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොහොර සහනාධාර ක්‍රමය යටතේ පසුගිය වර්ෂයේ සිට ලබා දුන් රු.350.00ක පොහොර බෑගයක් සඳහා රු.150.00ක අමතර මුදලක් රක්ෂණාවරණයක් වශයෙන් අය කර ගත් බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, සහනාධාර යටතේ ලබා දෙන එක් පොහොර බෑගයක් වෙනුවෙන් රු.150.00ක මුදලක් අමතරව අය කර ගනිමින් ආරම්භ කළ රක්ෂණාවරණයේ පදනම කවරේද;

(iii) එම රක්ෂණාවරණය ආරම්භ කළ දින සිට මේ දක්වා ගොවීන්ගෙන් අය කර ගෙන ඇති මුළු මුදල කොපමණද;

(iv) එකී රක්ෂණාවරණය යටතේ හිමිකම් ඉල්ලීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල,— ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා ද; ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය සඳහා මං සලසන පාඨමාලා සඳහා පහසුකම් සැලසීමේ දී අවශ්‍ය නෛතික යටිතල පහසුකම් සැලසීම පිණිස ද; 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත ඉවත් කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

පියසේන ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**